## ශාසනය පවත්නා කාලය.

විනයපිටකයේ චූලවග්ගපාළියේ භික්ඛුනීඛන්ධකයේ හා අංගුත්තර නිකායේ අට්ඨකනිපාතයේ ද දක්නා ලැබෙන පාඨයක් දක්වමින් ඇතැම්හු 'මෙකල බුදු සස්නක් නැත, භික්ෂූන් නැත, දැනට සිටින භික්ෂූහු භික්ෂු ප්‍රතිරූපකයන් මිස නියම භික්ෂූහු නො වෙති ය, දැන් නියම සංඝරත්නය නැතය'යි පවසති. ඔවුන් ගෙනහැර දක්වන පාඨය මෙසේය.

> 'සචෙ ආනන්ද නලභිස්සා මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජං, චිරට්ඨිතිකං ආනන්ද බ්‍රහ්මචරියං අභවිස්ස, වස්සසහස්සං සද්ධම්මො තිට්ඨෙය්‍ය, යථො පි ඛො ආනන්ද

මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිතො න දනි ආනන්ද බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං භවිස්සති, පඤ්චෙවදනි ආනන්ද වස්සසතානි සද්ධම්මො ඨස්සති.

සෙය්‍යථාපි ආනන්ද - පෙ - සෙය්‍යථාපි ආනන්ද පුරිසො මහතො තළාකස්ස පටිගච්චේව ආළිං බන්ධෙය්‍ය යාවදෙව උදකස්ස අනතික්කමනාය. එවමෙව ඛො ආනන්ද මයා පටිගච්චේව භික්ඛුනීනං අට්ඨගරුධම්මා පඤ්ඤත්තා යාවජීවං අනතික්කමනීයාති.'

මේ පාඨයේ කෙටි අදහස 'වර්ෂ දහසක් පවත්නා සද්ධර්මය මාගමුන් බුදුසස්නෙහි පැවිදිවීම නිසා වර්ෂ පන්සියයක්පමණක් පවත්නක් වන්නේය. එසේ නොවී සද්ධර්මය වර්ෂ දහසක් ම පවතිනු පිණිස කලින් ම තථාගතයන් වහන්සේ විසින් භික්ෂුනීන්ට අෂ්ටගරු ධර්මය පනවන ලද්දේය' යනුයි.

පර්‍ය්‍යාප්ති සද්ධර්මය, ප්‍රතිපත්ති සද්ධර්මය, ප්‍රතිවේධ සද්ධර්මය යි සද්ධර්ම තුනක් ඇත්තේ ය. ඉහත දැක්වූ සූත්‍රයෙහි වර්ෂ දහසක් පවත්නේය යි වදරා තිබෙන්නේ සද්ධර්ම තුනෙන් ප්‍රතිවේධ සද්ධර්මය යයි අටුවාවල කියා ඇත්තේය. 'වස්සසහස්සං සද්ධම්මො තිට්ඨෙය්‍ය' යන පාඨයෙන් දැක්වෙන්නේ වර්ෂ දහසක් අංගසම්පූර්ණ ප්‍රතිවේධය පවත්නා බවත් ඉන් පසු ක්‍රමයෙන් පිරිහී යන බවත් මිස දැල්වෙමින් තිබෙන පහනක් සැණෙකින් නිවී යන්නාක් මෙන් වර්ෂ දහස පිරෙනු සමහම ප්‍රතිවේධය සම්පූර්ණයෙන් අතුරුදහන් වීමක් නො වන බව ය.

'වස්සසහස්ස'න්ති චෙතං පටිසම්භිදප්පභේදප්පත්ත ඛීණාසවානං වසෙනෙව වුත්තං, තතො පන උත්තරිම්පි සුක්ඛවිපස්සක ඛීණාසව වසෙන වස්සසහස්සං, අනාගාමිවසෙන වස්සසහස්සං, සකදගාමීවසෙන වස්සසහස්සං, සොතාපන්න වසෙන වස්සසහස්සන්ති එවං පඤ්චවස්ස සහස්සානි පටිවේධ සද්ධම්මො ඨස්සති.

(මනෝරථපූරණී)

http://www.dhammikaweb.com/

මේ මනෝරථපූරණී අටුවා පාඨයෙන් පිළිසිඹියාපත් රහතුන්ගේ වශයෙන් වර්ෂදහසක් ද, ශුෂ්ක විදර්ශක රහතුන්ගේ වශයෙන් වර්ෂ දහසක් ද, අනාගාමීන්ගේ වශයෙන් වර්ෂ දහසක්ද, සකෘදගාමීන්ගේ වශයෙන් වර්ෂ දහසක් ද, සෝතාපන්නයන්ගේ වශයෙන් වර්ෂ දහසක් ද මෙසේ පන්දහසක් අවුරුදු ප්‍රතිවේධ ධර්මය පවත්නා බව දැක්වේ. පිළිසිඹියාපත් රහතුන්ගේ වශයෙන් වර්ෂ දහසක් ද, ෂඩභිඥා රහතුන්ගේ වශයෙන් වර්ෂ දහසක් ද, ත්‍රිවිද්‍යා රහතුන්ගේ වශයෙන් වර්ෂ දහසක් ද, ශුෂ්කවිදර්ශක රහතුන්ගේ වශයෙන් වර්ෂ දහසක් ද, පෘථග්ජන භික්ෂූන්ගේ වශයෙන් වර්ෂ දහසක් ද බුදු සසුන පවත්නා බව **සම්පසාදනිය සූත්‍ර අටුවාවෙහි** කියා තිබේ. දැනට පවත්නේ බුදුසසුනේ තුන්වන වර්ෂ දහසය. මේ කාලය **මනෝරථපූරණියෙහි** කියන අන්දමට අනාගාමීන් සිටිය හැකි කාලයයි. **දීඝනිකායට්ඨ කථාවෙහි** දැක්වෙන අන්දමට ත්‍රිවිද්‍යා ඇති රහතුන් සිටිය හැකි කාලයයි.

පිටකත්‍රය සංඛ්‍යාත පර්‍යාප්ති සද්ධර්මය ලෙහෙසියෙන් සුළු කලකින් නැතිවිය හැකියක් නොවේ. ටික තැනක ටික දෙනෙක් අත පමණක් පවත්නා දේවල් ලෙහෙසියෙන් නැති වී යා හැකිය. පර්‍යාප්ති සද්ධර්මය බොහෝ ගම්වල බොහෝ නගරවල බොහෝ පෙදෙස්වල බොහෝ රටවල බොහෝ භික්ෂූන් අතර පැතිර පවතින්නකි. එය එක විහාරයක නැති වුව ද තවත් දහස් ගණනක් විහාරවල පවතී. එක ගමක එක රටක නැති වුව ද තවත් බොහෝ ගම් රටවල පවතී. එබැවින් එය ලෙහෙසියෙන් නැති කළ නො හැකිය. එය කලින් කලට පැතිර පවත්නා ප්‍රදේශ අඩු වැඩි වෙමින්, දීර්ඝ කාලයක් පවතිනු ඇත. වර්ෂ පන්දහසකින් තබා දසදහසකිනුදු එය නැතිවෙතැයි නො සිතිය හැකිය.

සද්ධර්මයේ මූලය පර්යාප්තියය. බෙහෙත් වට්ටෝරුව පවත්නා තුරු වුවමනා අයෙකුට බෙහෙත සාදගත හැකි බැවින් බෙහෙත නැති වූයේ නොවේ. බෙහෙත නැති වූයේය යි කිය යුත්තේ බෙහෙත් වට්ටෝරුව නැති වුව හොත්ය. එමෙන් ප්‍රතිපත්ති ප්‍රතිවේධයන් ඇති කර ගන්නා ක්‍රමය දක්වන පර්යාප්ති සද්ධර්මය

http://www.dhammikaweb.com/

පවත්නා තුරු ප්‍රතිපත්ති - ප්‍රතිවේධ දෙක අතුරුදහන්වී යයි නො කිය හැකිය. වුවමනා කෙනකුට පර්‍යාප්තිය අනුව ප්‍රතිපත්තිය හා ප්‍රතිවේධය ඇති කර ගත හැකිය. භික්ෂු පරම්පරාව සිඳී ගියහොත් මහණ කම හා උපසම්පදාව පමණක් නැවත ඇති කළ නො හැකිය.

සංඝරත්නය නොයෙක් රටවල පැතිර සිටින විශාල පිරිසකි. එක් පෙදෙසක එක් රටක භික්ෂූන් නැති වී ගිය ද තවත් බොහෝ ප්‍රදේශවල භික්ෂූහු වෙසෙති. එබැවින් බුදුරදුන් දිවමන් කල පටන් මේ වන තුරු භික්ෂු පරම්පරාව පැවත අවුත් තිබේ. බුදුරජාණන් වහන්සේගේ අදහස ලෝකයෙහි සද්ධර්මය හෙවත් ත්‍රිවිධ ශාසනය ඉදිරියට බොහෝ කලක් පැවැත්වීමය. එබැවින් උන්වහන්සේ විසින් සද්ධර්මය ඉදිරියට පවත්වා ගැනීමට උපදෙස් දීම් වශයෙන් සද්ධර්මයාගේ චිරස්ථිතියට හා පරිහානියට හේතු දක්වන සූත්‍ර බොහෝ ගණනක් වදාරා ඇත්තේය. **මාගේ මේ විනය මේ ධර්මය මෙපමණ වර්ෂ ගණනකටය, ඉන් ඉදිරියට මේ ධර්මය හා විනය අවලංගුය කියා තථාගතයන් වහන්සේ විසින් ආඥාවක් පිහිටුවා නැත.** භික්ෂූහු යම් තාක් කල් තථාගතයන් වහන්සේගේ විනය අනුව කුලපුත්‍රයන් පැවිදි කෙරෙත් නම් උපසම්පද කෙරෙත් නම් එතෙක් සංඝරත්නය පවත්නේය. බුද්ධ කාලයේ පටන් අද දක්වා ම භික්ෂූන් විසින් එද පැවති විනය අනුවම කුලපුත්‍රයන් පැවිදි උපසම්පද කර ගෙන අවුත් ඇති බැවින් අද වාසය කරන භික්ෂූන් නියම භික්ෂූන් නො වීමට, අද සංඝයා නියම සංඝයා නො වීමට කිසිදු හේතුවක් නැත. එද බුදුරදුන් හා විසූ සැරියුත් මුගලන් ආදි මහරහතන් වහන්සේ හා අද සිටින භික්ෂූන් වහන්සේ ද එක ම පිරිසකි. එද විසූ රහතන් වහන්සේලා හා අද සිටින පෘථග්ජන භික්ෂූන් වහන්සේලා තථාගතයන් වහන්සේගේ එක ම ශ්‍රාවක සංඝරත්නය ය.

බොහෝ දහම් පොත් දක්නට ඇති බැවින්, ධර්මධරයන් දක්නට ඇති බැවින්, ධර්මදේශනා අසන්නට ඇති බැවින් මෙකල පර්‍යාප්ති සද්ධර්මය ඇති නැති බව ගැන සැක කරන්නට කරුණක් නැත. ධර්මය අනුව පිළිවෙත් පුරන බොහෝ ගිහි

පැවිද්දන් දක්නට ඇති බැවින් මෙකල ප්‍රතිපත්ති සද්ධර්මය ඇත ද? නැතද? කියා සැක කරන්නට කරුණක් නැත. **"ඉමෙ ච සුභද්ද භික්ඛූ සම්මා විහරෙය්‍යුං න සුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්ස"යි** "සුභද්දය, මේ භික්ෂූහු මැනවින් වෙසේ නම් ලෝකය රහතුන්ගෙන් හිස් නො වන්නේය"යි තථාගතයන් වහන්සේ විසින් වදාරා ඇති බැවින් පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ධර්ම දෙක පවත්නා කල්හි ප්‍රතිවේධය නැතය යි ද නො කිය හැකිය. ප්‍රතිවේධය නො පෙනෙන දෙයක් බැවින් එහි ඇති නැති බව කවදාවත් තේරුම් ගැනීම අපහසුය. වර්ෂ දහසකින් ශාසනය කෙළවර වේ නම් තථාගතයන් වහන්සේට "ඉමෙ ච සුභද්ද භික්ඛූ සම්මා විහරෙය්‍යුං න සුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්ස" යනු වදරන්නට කරුණක් නැත.